# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 171/2 — 1981 දෙසැම්බර් 14 වැනි සඳුදා — 1981.12.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.—බී. 10/80

### 1980 අංක 46 දරණ සේවානියුක්තයන්ගේ භාර අරමුදල් පනත

#### 16(2) වන වගන්තිය යටතේ නියමය

1980 අංක 46 දරණ සේවානියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 16 වන වගන්තියේ (2) වන උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කම්කරු අමාත්‍ය සිරිල් පින්තු ජයතිලක සෙනෙවිරත්න වන මම, මෙහි වූ උප ලේඛනයේ සඳහන් සේවා නියුක්තිය සම්බන්ධයෙන් 1981 දෙසැම්බර් මස 31 වන දින, ඒ උප වගන්තියේ කාර්ය සඳහා මේ නියමය මගින් නියම කරමි.

කපිතාන් සී. පී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු අමාත්‍ය.

1981 දෙසැම්බර් මස 09 වන දින,
කොළඹ දී ය.

#### උපලේඛනය

1980 අංක 46 දරණ සේවානියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ අර්ථානුකූලව—

- (අ) යම් ගෘහස්ථයක ගෘහ සේවයක් ;
- (ආ) හුදෙක් ආගමික වතාවත් සඳහා හෝ සමාජ සේවය සඳහා නැතහොත් පුණ්‍යායතනයක් වශයෙන් පවත්වාගෙන යනු ලබන්නා වූ ආයතනයක් නැතහොත් සංවිධානයක් ;
- (ඇ) ප්‍රධාන වශයෙන්, බාලාපරාධකරුවන්ට, මවපියන් නොමැති වූවන්ට හෝ අනාථ වූ, අඳ, ගොළු නැතහොත් බිහිරි තැනැත්තන්ට කාර්මික පුහුණුව ලබාදීම සඳහා පවත්වාගෙන යනු ලබන ව්‍යවසායක් ;
- (ඈ) ස්වකීය පවුලේ සාමාජිකයන් පමණක් සේවයෙහි නියුක්තව සිටින ව්‍යවසායක් වශයෙන්, තැනැත්තකු විසින් පවත්වාගෙන යනු ලබන යම් ව්‍යවසායක් ;

නොවන සේවානියුක්තයන් පනහකට අඩු සංඛ්‍යාවක් සේවයෙහි නියුක්තව සිටින යම් පෞද්ගලික අංශයේ ව්‍යවසායක සේවානියුක්තිය.-

මේ උපලේඛනයෙහි "පවුල" යන්න, යම් ව්‍යවසායක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ ව්‍යවසාය පවත්වාගෙන යනු ලබන තැනැත්තා, ඒ තැනැත්තාගේ භාර්යාව හෝ ස්වාමි පුරුෂයා, ඒ තැනැත්තාගේ යම් දරුවන් සහ ඒ භාර්යාවගේ නැතහොත් ස්වාමි පුරුෂයාගේ යම් දරුවන්, ඉන් අදහස් වේ.

1-26

---

ඉඩ්/ගා/5/125/10.

### 1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත

#### 6 ඡෙදය යටතේ සහතිකය

පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය රණසිංහ ප්‍රේමදාස වන මම, 1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතේ 6 වන ඡෙදය යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම, එම පනතෙහි 4 වන ඡෙදයෙහි අදහසට ඇතුලත් නිවාස අරමුණක් ක්‍රියාත්මක කිරීම සඳහා රජය මගින් අත්කර ගත යුතු බව මෙයින් සහතික කරමි.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය.

1981 නොවැම්බර් මස 25 වන දින,
කොළඹ දී ය.


I A—G 60520—3,050 (81/12)